# කුරුළු අම්මාගේ වේදනාව



හෙෂාරා විතුම්සා

# කුරුළු අම්මාගේ වේදනාව

හෙෂාරා විතුම්සා

මහමායා බාලිකා විද්‍යාලය මහනුවර

2 ශ්‍රේණිය E

# පිදුම

දෙවසරක් මුළුල්ලේ පෙළ පොතේ

අකුරු පෙළ ගලපමින් ඉතා

වෙහෙස මහන්සි වී

සිප් කිරි පෙවූ ආදරණීය

2 වසර ගුරුතුමිය වන

**ඊශ්වරී දිල්රුක්ෂි**

මහත්මියට

මේ පොත ගුරු උපහාරයක්ම

වේවා!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කුරුළු අම්මාගේ වේදනාව ....

නිවාඩු දවසක මම උදේම දොර ඇරගෙන එළියට ආවා. මම හරිම ආසයි වත්තේ ඇවිදලා මල් පිපිලා තියෙනවා බලන්න.



මම මල් අත ගගා ඉද්දි දැක්කා අල්ලපු ගෙදර නැන්දලාගේ තාප්පේ ළඟ කුරුළු රංචුවක් කෑ ගහනවා.

මම ආසාවෙන් ඒ දිහා බලන් හිටියා. එතකොට තමයි දැක්කේ කුරුළු අම්මා සහ කුරුළු තාත්තා හොටෙන් කෝටු කෑලි ගෙනවිත් අල්ලපු ගෙදර ලියුම් පෙට්ටිය ඇතුළේ ලස්සන කූඩුවක් හදනවා.

අම්මේ..... අම්මේ..... ඉක්මනට එන්න. අම්මා එතනට දුවගෙන ආවා.

ඇයි පුතේ?

අර බලන්නකො අම්මෙ ලස්සන කුරුළු කූඩුවක් හදනවා.කුරුල්ලෝ ගොඩයි.



හැමෝම කූඩුව හදන්න උදව් කරනවා නේද අම්මේ.......

ඒක තමයි පුතේ......ඔයාලත් බලලා ඉගෙන ගන්න. සතුන් පවා සමගියෙන් කටයුතු කරන විදිහ ......

පහුවදාත් මම  ඇවිත් බලන් හිටියා. කුරුළු තාත්තා හොටෙන් පොල් කෙඳි ගෙනාවා. කුරුළු අම්මා ඒවා ලස්සනට තබා කුරුළු කූඩුවක් හදනවා……

ඔය කුරුළු ජෝඩුව එහෙට මෙහෙට පියඹලා කෑම සොයාගෙන එනවා හරිම අපූරුයි.....



අම්මේ මේ කුරුල්ලාගේ නම මොකක්ද?

පුතේ මේ ගොල්ලන්ට කියන්නේ “ගේ කුරුල්ලා “ කියලා..

කුරුල්ලා දැක්කේ නැති නිසා සතියකට විතර පස්සේ මම තාප්පෙන් එබිලා බැලුවා..

මම දැක්කා ඒ කූඩුවේ පොඩි බිත්තර හතරක් තියනවා.මට හරිම සතුටුයි.

අම්මේ.....අම්මේ.....අර කුරුල්ලා බිත්තර දාලා.

ඒක තමයි පුතේ....තව ටික දවසකින් පුංචි ගේ කුරුළු පැටවු එළියට එයි.

ඔයා ආසයිද පුංචි පැටවු බලන්න.?

අනේ ඔව් අම්මේ.....මම හරීම ආසයි......

සතියකට විතර පස්සේ බලද්දී චූටි ගේ කුරුළු පැටවු කිචි බිචි ගානවා ඇහුනා.

කුරුළු අම්මා හොටෙන් කෑම ගෙනල්ලා කවනවා.



තාම පැටවුන්ට පිහාඹන්න බෑ.

මම පාසල් ඇරිලා ගෙදර එන විට හවස අම්මා මිදුලේ හිටියා.



මම කුරුළු කූඩුව දෙස ආසාවෙන් බලා හිටියා. අම්මා හා තව නැන්දා කෙනෙකුත් හිටියා.



එකපාරටම එතනට ලොකු ඇටි කුතුළෙක් පියාඹගෙන අවා.ඇටි කුතුළා පැටව් ටික එක කටට අරගෙන පියාඹලා ගියා.කුරුළු අම්මා හා කුරුළු තාත්තා කෑ ගහගෙන ඒ පස්සෙන් පියැඹුවා....

අපේ අම්මා සහ මම හයියෙන් කෑ ගහගෙන ගල් ගැහුවා

.ඒත් බේරගන්න බැරි වුනා..

කුරුල්ලන් ගොඩක් එතනට ඇවිත් හයියෙන් කෑ ගහනවා.මටත් හරි දුකයි. මමත් හොඳටම ඇඬුවා.

කුරුළු අම්මා මහා වේදනාවෙන් ලියුම් පෙට්ටිය වටේට  කැරකි කැරකි කෑ ගහනවා.අම්මා කිව්වා එහෙම තමයි පුතේ ..

මේ පැටව් රැකගෙන ලොකු කරගන්න හරිම අමාරුයි.ඔයාලත්  එහෙම තමයි. බොහොම අමාරුවෙන් තමයි රැකගෙන තියෙන්නේ කියලා අම්මා කිව්වා.

**මට ඒ වේදනාව දරා ගන්න හරිම අමාරුයි.**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

නිමි.

ISBN-978-624-208-734-4.